සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

<u>සැලකිය යුතුයි.</u>

**(i)** සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(01) ගාබ්‍රියෙල් දේව දූතයා සෙකරියස් පූජකතුමා වෙත දර්ශනය වූයේ,

(1) සෙනඟ සමඟ යාච්ඤා කරමින් සිටින විට ය.
(2) සුවඳ දුම් පූජා පවත්වන වේලෙහි ය.
(3) දාදු දමමින් සිටි අවස්ථාවෙහි ය.
(4) එලිසබෙත් හා කථා කරමින් සිටින විට ය.

(02) පහත සඳහන් කරුණු අතුරින් ආබ්‍රහම් සම්බන්ධයෙන් සත්‍ය වනුයේ,

(1) ප්‍රතිචාරය ⟶ අත්දැකීම ⟶ පීඩාව
(2) ඇදහිල්ල ⟶ කැඳවීම ⟶ ගිවිසුම
(3) ගිවිසුම ⟶ පීඩාව ⟶ කීකරුකම
(4) අත්දැකීම ⟶ කීකරුකම ⟶ ප්‍රතිචාරය

(03) 'මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙළ කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි' මෙහි මාගේ දූතයා ලෙස දිවැසිවර මලාකි හඳුන්වන්නේ,

(1) ජේසුස් වහන්සේ පිළිබඳව ය.
(2) ගාබ්‍රියෙල් දේව දූතයා පිළිබඳව ය.
(3) ස්නාවක ජොහාන් පිළිබඳව ය.
(4) දිවැසිවර යෙසායා පිළිබඳව ය.

(04) මෙසියස් වහන්සේගේ රාජ්‍යය සුවිශේෂී වීමට වඩාත් වැදගත් හේතුව නම්,

(1) එහි දිවැසිවරුන් පමණක් වාසය කරන බැවිනි.
(2) එය බාහිර තර්ජනවලින් ආරක්ෂිත බැවිනි.
(3) එහි සියල්ලන් ම ප්‍රඥාවෙන් පූර්ණ බැවිනි.
(4) එහි සාමයට කෙළවරක් නොවන බැවිනි.

Department of Education – Western Province

(05) දොළොස් වියැති ජේසුස් වහන්සේ දේව මාළිගයේ රැඳී සිටීමේ සිදුවීමෙන්,

(1) අධ්‍යාපනයේ වැදගත්කම ඉස්මතු වේ.

(2) දේව කැමැත්තට මූලිකත්වය දීමේ වැදගත්කම ඉස්මතු වේ.

(3) දෙමාපිය තීරණවල අඩුපාඩු පෙන්වා දීමේ වැදගත්කම ඉස්මතු වේ.

(4) තරුණ පරපුරට ස්වාධීන තීරණ ගැනීමේ අයිතිය ලබාදීමේ වැදගත්කම ඉස්මතු වේ.

(06) ජේසුස් වහන්සේගේ යහපත් බැටළු එඬේර ඉගැන්වීම් තුළ,

(1) එඬේරකුගේ ලෞකික බලාපොරොත්තු අන්තර්ගත වී තිබිණ.

(2) එඬේර වෘත්තියේ පොදු ගැටළු පිළිබඳව අන්තර්ගත වී තිබිණ.

(3) දේව ප්‍රේමය, පෝෂණය හා ආරක්ෂාව අන්තර්ගත වී තිබිණ.

(4) දෙවියන් වහන්සේ එඬේරුන්ට සලසන විශේෂ සහන හා වරප්‍රසාද අන්තර්ගත වී තිබිණ.

(07) ඇය දේව මාළිගයේ රැඳී උපවාසයෙන්, යැදුමින් දේව සබඳතාවය අපේක්ෂාවෙන් සිටියාය' මෙම හැඳින්වීම අදාළ වනුයේ,

(1) අන්නා ට ය. (2) මරියතුමිය ට ය.

(3) එලිසබෙත් ට ය. (4) හන්නා ට ය.

(08) දුක් උසුලන සේවක භූමිකාව ජේසුස් වහන්සේ තුළින් පරිපූර්ණත්වයට පත්වූ බව විද්‍යාමාන වනුයේ,

(1) උන්වහන්සේගේ කුරුසිපත්වීම මගිනි.

(2) උන්වහන්සේගේ පුනරුජ්ජීවනය මගිනි.

(3) උන්වහන්සේගේ සියලු දේශනා මගිනි.

(4) උන්වහන්සේගේ ප්‍රාතිහාර්ය මගිනි.

(09) නාසරෙත් සිනගෝගයේ රැස් වූ ජනයාගේ ප්‍රතිචාර කීපයක් පහත දැක්වේ.

A ජේසුස් වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ මවිත වීම

B ජේසුස් වහන්සේ පිළිබඳ කෝපාවිෂ්ඨ වීම

C ජේසුස් වහන්සේට නැවතත් දේශනා කරන ලෙස ඇවිටිලි කිරීම

D ජේසුස් වහන්සේ උපහාසයට ලක්කිරීම

ඒ අතුරින් නිවැරදි වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) C හා D ය. (4) D හා B ය.

(10) 'තමාට මෙන් ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම' යන්නෙන් ජේසුස් වහන්සේ විසින් අවධාරණය කරනු ලැබුවේ,

(1) සියලු සැදැහැවතුන් තමා අතරම ප්‍රේමය පතුරවාලීමයි.

(2) තමා වටා සිටින අවශ්‍යතාවෙන් පෙළෙන සැමට අසීමිත ප්‍රේමය දැක්වීමයි.

(3) තම පුද්ගලභාවයට ගරුත්වය දක්වන අයට එම ප්‍රේමය ම පිරිනැමීමයි.

(4) ජුදෙව්වන් විසින් සිය ආගමට හා ජාතියට අයත් අයට පමණක් ප්‍රේම කිරීමයි.

Department of Education – Western Province

(11) සිය මෙහෙය මගින් ස්නාවක ජොහාන් විසින් ඉස්මතු කරනු ලැබුයේ,

(1) මනස්ථාපනයයි. (2) නිහතමානීත්වයයි.

(3) දයානුකම්පාවයි. (4) ස්ථානෝචිත ප්‍රඥාවයි.

(12) ශුභාරංචි විප්ලවයක් දියත් කරන ලද්දේ,

(1) චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය. (2) ගරු තිස්ස බාලසූරිය පියතුමා ය.

(3) ගරු පීටර් ජෙරාඩ් පියතුමා ය. (4) ගරු මයිකල් රොද්‍රිගු පියතුමා ය.

(13) කිතුනුවන් ජේසුස් වහන්සේගේ දුක් විඳීමට පංගුකරුවන් වනුයේ,

(1) නිරන්තර යාච්ඤාවෙනි.

(2) උන්වහන්සේගේ දුක්විඳීම සිහිපත් කර ශෝක වීම තුළිනි.

(3) දේව වදන් දිනපතා කියවීම තුළිනි.

(4) ශු. සහභාගීකමට භාගී වීම මගිනි.

(14) 'දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ' යැයි කියනු ලබන්නේ,

(1) ශෝකවන්නන්ට ය. (2) සාමය ඇති කරන්නන්ට ය.

(3) සිතින් දිළිඳු අයට ය. (4) යුක්තිය උදෙසා පීඩා විඳින්නන්ට ය.

(15) විනයධරයෙකුගේ පැනයකට විසඳුමක් ලෙස ජේසුස් වහන්සේ පැවසූ උපමාව නම්,

(1) යහපත් සමාරිතයා ය. (2) පරිසියා හා අයකැමියා ය.

(3) පොහොසත් මෝඩයා ය. (4) මුහුන් ය.

(16) ටෝරාව හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු කලෙක පාවුල්තුමා ලද වාසිය වූයේ,

(1) රෝමයේ දී සාක්ෂි දැරීමට ඉඩ ප්‍රස්ථාව ලැබීමයි.

(2) විජාතීන්ගේ අපෝස්තුළුවරයා වීමයි.

(3) සිරගෙයින් මිදී යෑමට අවකාශ ලැබීමයි.

(4) පහසුවෙන් ජුදෙව්වන් සමඟ වාද කිරීමට හා තර්ක කිරීමට ලැබීමයි.

(17) මුල් කිතුනු සභාව මගින් ඉටුකළ වැදගත් සේවාවක් වූයේ,

(1) ධර්මදාන සේවයයි. (2) උපදේශන සේවයයි.

(3) සරණාගත සේවයයි. (4) වෛද්‍ය සේවයයි.

(18) දේව රාජ්‍ය පිළිබඳ සිසුවකු විසින් ලියන ලද කරුණු කීපයක් පහත දැක්වේ.

A විශ්වයෙහි දිවි ගෙවන සියලු දෙනාට දේව රාජ්‍යයේ අධිකාරීත්වය හිමිවේ.

B දේව රාජ්‍යය ගැඹුරු අභිරහස්මය ක්‍රියාවලියකි.

C දේව කැමැත්ත ඉටුකරන්නෝ දේව රාජ්‍යයේ පුරවැසියෝ ය.

D විවිධ රටවල්වල නීති මගින් දේව රාජ්‍යයේ නීතිමාලාව පෝෂණය වේ.

ඒ අතුරින් නිවැරදි වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා B ය.



Department of Education Western Province

(19) ''නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්න'' යන ප්‍රකාශ සඳහා කිතුනු ප්‍රතිචාරය විය යුත්තේ,

(1) දේව බලය තුළින් තම සුබ විහරණය හා රැකවරණය සලසා ගැනීමෙනි.

(2) දෙවියන් වහන්සේගේ සැලසුම් හා අරමුණු පරීක්ෂා නොකිරීමෙනි.

(3) උපරිම යහපත් මාර්ගය දේව කැමැත්තට අනුකූලව තෝරා ගැනීමෙනි.

(4) දෙවි සමිඳුන්ට හිමි ගෞරවය කිසිවකුට හා කිසිවකට හිමිකර නොදීමෙනි.

(20) 'කල්වරි කුරුසිය තුළින් නැගෙන්නේ,

(1) පාපයේ බිහිසුණු බව ය. (2) ගැළවීමේ ජය හඬය.

(3) අසාධාරණයේ බලවත් බව ය. (4) දේවත්වයට බාධා පැවති බවය.

(21) කෙන්ක්‍රෙයාවේ දී පාවුල්තුමා සිදුකළ විශේෂ ක්‍රියාව නම්

(1) භාරයක් සඳහා හිස මුඩු කර ගැනීමයි. (2) එපිකූරිය පණ්ඩිතයන් මුණගැසීමයි.

(3) වහල් තරුණියක් ගැළවීමට ගෙන ඒමයි. (4) දෙවිඳුන්ට පූජාසනයක් ගොඩ නැගීමයි.

(22) ''බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත.'' යන අභියෝගයට ප්‍රතිචාර දැක්වීමට නම් කිතුනුවන් ප්‍රගුණ කළ යුතු වනුයේ,

(1) බුද්ධිමත්බව, තර්කානුකූල බව හා විශ්වාසයයි.

(2) උද්‍යෝගශීලිත්වය, නිර්භීතබව හා කැපීකත්වයයි.

(3) කීකරුකම, නිහතමානීත්වය හා ඇදහිල්ලයි.

(4) පක්ෂපාතීත්වය, යහපත්බව හා දයානුකම්පාවයි.

(23) කිතුනු බලාපොරොත්තුව

A සදාතන ජීවනය හා බැඳෙන්නකි.

B ලෞකික බලාපොරොත්තු සමඟ අත්වැල් බැඳ ගත්තකි.

C පෞද්ගලිකත්වය ම. ගොඩනැගෙන්නකි.

D විශ්වාසය තුළ ඉදිරියට යන්නකි.

ඒ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා A ය.

(24) මැවිල්ල තුළ පුරුෂයාට හා ස්ත්‍රියට හිමිවන්නේ,

(1) සමතත්ත්වයකි. (2) ආධිපත්‍යයකි. (3) අභිමානයකි. (4) වරප්‍රසාදයකි.

(25) ජේසුස් වහන්සේගේ නාසරෙත් දේශනයට අනුව අපගේ සේවයේ දී ප්‍රමුඛතාවය දිය යුතු වන්නේ,

(1) අප පවුලේ අය වෙතට ය.

(2) අන්‍යාගමිකයන් වෙතට ය.

(3) සමාජයේ ප්‍රතික්ෂේපිත ජන කොට්ඨාස වෙතට ය.

Department of Education – Western Province

(4) උපකාර අවශ්‍ය කිතුනුවන් වෙතට ය.

(26) කිතුනු අනන්‍යතාවය දරමින් මානව සබඳතා සහිතව දිවිගෙවීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාදාමයන් කීපයක් පහත දැක්වේ.

A ඒ ඒ පරිසරවලට සංවේදී වෙමින් වදනින් හා ක්‍රියාවෙන් කිතුනුවකු ලෙස ක්‍රියා කිරීම

B සමාජයේ ඉහළ නිලධාරීන් සමඟ උසස් මානව සබඳතා පවත්වා ගැනීම

C අන්‍ය මත හෙළා දකිමින් තමාගේ මතය අන්‍යයන්ට කෙසේ හෝ පිළිගැන්වීම

D යාච්ඤාවේ පෙරදැරිව සාමූහික සමාජ මෙහෙවරෙහි යෙදීම

ඒ අතුරින් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා A ය.

(27) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව නිරන්තරයෙන් ම දේව රාජ්‍යය හිමිකර ගැනීමට සුදුස්සන් වනුයේ,

(1) දරුවන් මෙන් නිහතමානීව, නිරහංකාර ජීවිත ගත කරන අය ය.

(2) ශුද්ධාත්ම බව්තීස්මය අත්දැක තිබෙන අය ය.

(3) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අන් අයට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති අය ය.

(4) අභියෝග මැද දිවි ගෙවමින් ජීවිතය ජය ගන්නා අය ය.

Department of Education – Western Province

(28) පහත සඳහන් වන්නේ ලක්ෂණ කීපයකි.

A සමාජයේ වැඩි පිරිසක් තම ආශ්‍රයෙන් බැහැර කරලීම

B ශුභාරංචිය පැතිරවීමට ක්‍රියා කිරීම

C නායකත්ව හිමිකම් තහවුරු කර ගැනීමට කටයුතු කිරීම

D වාචික සම්ප්‍රදාය හා මරණින් මතු දිවිය පිළිබඳ විශ්වාස නොකිරීම

මේ අතුරින් සද්දුසිවරුන්ට අයත් ලක්ෂණ නම්,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා A ය.

(29) වත්මන් සමාජය තුළ පිලාත් භූමිකාව ක්‍රියාවට නැගෙනුයේ,

(1) අල්ලස් ලබා දී සිය කාර්යයන් ඉටුකර ගන්නන්ගෙනි.

(2) දිළිඳුන්ගේ ශ්‍රමය සූරාකන්නන්ගෙනි.

(3) අන් අයගේ බලපෑම් ඉදිරියේ තමා ගත් තීරණ වෙනස් කරන්නන්ගෙනි.

(4) නීති තම අණසකට ගත් බවට පුරසාරම් දොඩවන්නන්ගෙනි.

(30) යොවුන් වියේ දී ජේසුස් වහන්සේ තුළ ජීවිත පෙරළියක් අත්දැකීමෙන් අප ලබන යහපත් ප්‍රතිඵලයකි.

(1) තරඟකාරී සමාජයේ තමාට හිමි ස්ථානය සොයා ගැනීම

(2) දුරාචාරයෙන් තොර සදාචාරවත් දිවි පෙවෙතක් ගත කිරීම

(3) අන් අයගේ විශේෂ පිළිගැනීමට නිරතුරුව යොමු වීම

(4) බොහෝ ලෞකික සම්පත් රැසක් අත්පත් කරගැනීමට අවකාශ ලැබීම

(31) මමත්වය නසන කිතුනුවාගේ හෘදයංගම යැදුම විය යුත්තේ,

(1) 'පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගළවාගත මැනව' යන්නයි.

(2) 'සත්වාර සැත්තෑවක් කමා කළ මැනව' යන්නයි.

(3) 'ඔබගේ රාජ්‍ය ඒවා' යන්නයි.

(4) 'මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා' යන්නයි.

(32) පාවුල්තුමාගේ ආදර්ශය අනුව කිතුනු ධර්මදූත සේවය සඳහා වඩාත් වැදගත් වන්නේ,

A හවුල් නායකත්වයට ඉඩ නොතැබීමයි.

B අන්‍ය මතවල ඇති වැරදි පෙන්වාදීමයි.

C අභියෝග මධ්‍යයේ දෙවිඳුන් පැසසීමයි.

D අවස්ථානුකූලව සිය දහම වෙනස්කිරීමයි.

මේ අතුරින් නිවැරදි වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(33) පුහුණු කර යවනු ලැබූවන් හඳුන්වනු ලැබුයේ,

(1) මෙසියස් නමිනි. (2) ක්‍රිස්තොස් නමිනි.

(3) රූආක් නමිනි. (4) අපොස්තුළු නමිනි.

(34) ආමොස් දිවැසිවරයාගේ මෙහෙය මගින් ජනතාව යොමු කරනු ලබන්නේ,

(1) දේව විනිශ්චයෙන් සැඟවීම සඳහා ය. (2) සැබෑ පසුතැවීමක් සඳහා ය.

(3) ආර්ථික සංවර්ධනයක් සඳහා ය. (4) සාම යුගයක් බිහිකිරීම සඳහා ය.

(35) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම පරිදි කුඩා රැළ බිය නොවිය යුත්තේ,

(1) ඔවුන්ට රාජ්‍ය දීමට පියාණන් වහන්සේ සැදී පැහැදී සිටින බැවිනි.

(2) ඔවුන්ගේ ලෞකික අවශ්‍යතා උන්වහන්සේ කෙසේ හෝ ඉටුකරන බැවිනි.

(3) ඔවුන්ගේ සතුරන් දෙවියන් වහන්සේ විසින් විනාශ කර දමන බැවිනි.

(4) ඔවුන්ට ප්‍රඥාවේ ආසිරි වැසි වස්සවන බැවිනි.

(36) පේදුරුතුමා හා ජොහාන්තුමා ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙන යෑමේ සිදුවීම මගින් පැහැදිලි වනුයේ,

(1) දේව හඬට නිසි ප්‍රතිචාර දක්වීම කිතුනු වගකීම බව ය.

(2) සේවය අවශ්‍ය සැමට ම ඕනෑම විටෙක සේවය කිරීම සඳහා ඉදිරිපත් විය යුතු බව ය.

(3) ජේසුස් වහන්සේගේ නාමයෙන් නිර්භීතව සේවය කිරීම සඳහා ශුද්ධාත්ම දිරිය හා සවිය නිරතුරුවම ලැබෙන බවය.

(4) දෙවියන් වහන්සේ සියලු ජාතීන් හට සාධාරණ විනිශ්චයක් ලබාදෙන බව ය.

Department of Education – Western Province

(37) ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමාගෙන් බව්තීස්මය ලැබීමේ සිදුවීමෙන් පැහැදිලි වන සත්‍යතාවක් නම්,

(1) අප නිරතුරුවම පාප පිළිබඳව මනස්ථාපනය විය යුතු බව ය.

(2) ශුද්ධාත්මයාණන් වහන්සේ නව ජීවිත පැවැත්මකට ආලෝකය, ශක්තිය හා ධෛර්යයෙන් කිතුනුවා සන්නද්ධ කරන බවය.

(3) දුක් විඳීමේ අවස්ථා හා අභියෝගවලට මුහුණ දීමට සවිය ගෙන දෙන සම්දාණෝ අප විජයග්‍රහණයට පත්කරන බව ය.

(4) දේව කැමැත්තට අවනත වීමෙන් දේව රාජ්‍යය ගොඩ නැගීමේ කාර්යය පහසු බව බව ය.

(38) දේව රාජ්‍යයේ කාර්යයන් ඉටුකිරීමේ දී අප ක්‍රියා කළ යුතු ආකාරය පහත දැක්වේ.

A ආශිර්වාද ලැබීම අපේක්ෂාවෙන් ඉටු කිරීම

B විශාල කැපවීමකින් ඉටුකිරීම

C අන් අයගේ ස්තුති ප්‍රශංසා මධ්‍යයේ එය ඉටුකිරීම

D අන් කටයුතුවලට බාධා නොවන සේ ඉටු කිරීම

E කීකරුව හා නිහතමානීව ඉටු කිරීම

ඒ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A හා C ය. (2) B හා E ය. (3) C හා D ය. (4) D හා A ය.

(39) මෙලොව අප ගත කරන මරණීය ජීවිතය අමරණීය වීමට නම්,

(1) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් කුරුසියක මරණය අත්දැකිය යුතු ය.

(2) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් අන් අයගේ ආත්ම ගැළවිය යුතු ය.

(3) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ සියලු අපේක්ෂාවන්ගෙන් මිදිය යුතු ය.

(4) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඒකාබද්ධ විය යුතු ය.

Department of Education – Western Province

(40) කිතුනුවන් මාංශික තෘෂ්ණාවලට වසඟ නොවීම සඳහා,

(1) සමාජ වටපිටාව සැකසිය යුතු ය.

(2) ලෞකික ජීවිතයෙන් බැහැර විය යුතු ය.

(3) ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම ඇතිව හැසිරිය යුතුය.

(4) බුද්ධිමත් ලෙස ක්‍රියාකරමින් ප්‍රශ්න ගැටළු පිටුදැකිය යුතුය.

(ලකුණු 1 × 40 = 40)